සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

පැය එකයි
One hour

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා ලබා දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරාන්න.

01 මිනිස් අවශ්‍යතා ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) ආහාර, නිවාස, සෞඛ්‍යය (2) ආහාර, නිවාස, ගවුම
(3) ආහාර, තට්ටුගෙවල්, අධ්‍යාපනය (4) ආහාර, නිවාස, බත්

02 ව්‍යාපාරයක් හැඳින්වීම සඳහා වඩාත් සුදුසු ප්‍රකාශය කුමක් ද?

(1) ලාභ ලැබීමේ අරමුණින් කරන ඕනෑම කටයුත්තකි.
(2) භාණ්ඩ හෝ සේවා අලෙවිකරණ සිල්ලර හෝ තොග වෙළඳසැලකි.
(3) මිනිස් අවශ්‍යතා සපුරාලීමට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත කටයුත්තකි.
(4) මිනිස් වුවමනා සපුරාලීමට භාණ්ඩ නිෂ්පාදනය සිදු කරන ඕනෑම ආයතනයකි.

03 භාණ්ඩයකට හා සේවාවකට නිදසුන් පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

(1) ආහාර, පිට්ටු (2) බෙහෙත්, වෛද්‍ය සේවය
(3) ප්‍රවාහනය, රක්ෂණය (4) නීති සේවය, සිමෙන්ති

04 පහත දක්වෙන ව්‍යාපාර ආයතන අතරින් සේවා සැපයීමේ නිරත ආයතන කුමක් ද?

(1) අරලිය සබන් නිෂ්පාදකයෝ (2) කෝසල සිමෙන්ති ගඩොල් නිෂ්පාදකයෝ
(3) අමාලි තොග හා සිල්ලර වෙළෙන්දෝ (4) සුපර් ටයර් නිපදවන්නෝ

05 ව්‍යාපාර ආයතනය සතු ගණකාධිකාරිවරු හා ව්‍යාපාර ආයතනයේ මෝටර් රථය අයත්වන නිෂ්පාදන පිළිවෙලින් දක්වෙන්නේ,

(1) ශ්‍රමය, භූමිය (2) ව්‍යවසාය, ශ්‍රමය
(3) ව්‍යවසාය, ප්‍රාග්ධනය (4) ශ්‍රමය, ප්‍රාග්ධනය

06 භාණ්ඩ හා සේවා සඳහා මිල ගෙවීමේ දී පොදුවේ භාවිතා කෙරෙන මාධ්‍යය හැඳින්වෙන්නේ,

(1) මුදල් ලෙසය. (2) වෙළඳාම ලෙසය. (3) පිරිවැය ලෙසය. (4) හුවමාරුව ලෙසය.

07 අයිතිකරුවෝ ව්‍යාපාරය කෙරෙහි ඇල්ම දක්වීමට අදාළ අරමුණක් වන්නේ,

(1) රැකියා සුරක්ෂිත බව (2) ආයෝජනයේ සුරක්ෂිත බව
(3) තරගයට මුහුණ දීමට (4) සමාජ සුභසාධනයට

08 ව්‍යාපාරයක ..................①.................................... සාධාරණ වැටුප් ලබා ගැනීම පිළිබඳව උනන්දුවක් දක්වන අතර .................................②.................... ගුණාත්මක නිෂ්පාදන ලබා ගැනීම පිළිබඳව උනන්දුවක් දක්වති.

ඉහත ප්‍රකාශයේ ① හා ②යන ස්ථාන වලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දක්වෙන පිළිතුරු තෝරන්න.

(1) ගනුදෙනුකරුවෝ, තරගකරුවෝ (2) සේවකයෝ, ආයෝජකයෝ

(3) කළමනාකරුවෝ, සැපයුම්කරුවෝ (4) සේවකයෝ, ගණුදෙනුකරුවෝ

09 පහත දැක්වෙන ව්‍යාපාර පරිසරයට අයත් සාධක කිහිපයකි.

A අයිතිකරුවෝ B ගනුදෙනුකරුවෝ

C තරගකරුවෝ D කළමනාකරුවෝ

E සැපයුම්කරුවෝ F සේවකයෝ

ඉහත සාධක අතරින් අභ්‍යන්තර පරිසරයට අයත් සාධක පමණක් දක්වෙන පිළිතුර වන්නෙ,

(1) A, B, E (2) A, D, F (3) B, C, D (4) C, D, F

10 ''භාණ්ඩ හා සේවා අලෙවියේ දී තීරණය වන පොදු මිල ගණන් ඉහල යාම'' මෙම ප්‍රකාශයෙන් හැඟවෙන ව්‍යාපාර පරිසයරය කුමක් ද?

(1) ආර්ථික පරිසරය (2) තාක්ෂණික පරිසරය (3) ගෝලීය පරිසරය (4) දේශපාලන පරිසරය

11 විද්‍යුත් තැපැල, පරිගණක හා තොරතුරු පද්ධති, පරිගණක ගත කළ යන්ත්‍ර සූත්‍ර ආදිය ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අයත්වන පරිසර සාධකය වන්නේ,

(1) ගෝලීය පරිසරයයි. (2) තාක්ෂනික පරිසරයයි. (3) ආර්ථික පරිසරයයි. (4) දේශපාලන පරිසරයයි.

12 ව්‍යාපාරයක ශක්තීන් හා අවස්ථා කිහිපයක් පහත දක්වේ.

A සේවකයින්ගේ යහපත් ආකල්ප. B පිළිගත් සන්නම් නාමයක් තිබීම.

C ජාත්‍යන්තර වෙළඳ සම්බාධක පැනවීම. D ව්‍යාපාර සඳහා බදුසහන ලබා දීම.

මෙහි සඳහන් ශක්තීන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A, C (2) C, D (3) A, B (4) B, D

13 ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය තුළින් හඳුනා ගත හැකි අවස්ථාවක් හා තර්ජනයක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සුවිශේෂී නිෂ්පාදන ක්‍රම - සේවකයින්ගේ අයහපත් ආකල්ප

(2) අධිවේගී මාර්ග ඉදි කිරීම - ප්‍රමාණවත් ප්‍රාග් ධනයක් නොතිබීම

(3) අඩුපොළී ණය ක්‍රම - කළමනාකරුවන්ගේ අත්දැකීම් අඩුවීම

(4) ව්‍යාපාරවලට හිතකර නීති රීති - ස්වාභාවික ආපදා

14 රජය විසින් සම්මත කර ඇති ව්‍යාපාරවලට අදාළව අණපනත් හා නීතිරීති වලට අදාළ ව්‍යාපාර පරිසරය කුමක් ද?

(1) ආර්ථික පරිසරය (2) දේශපාලන පරිසරය

(3) නෛතික පරිසරය (4) ගෝලීය පරිසරය

15 ''රොෂානි''ගේ ව්‍යාපාරයේ කළමනාකරු ව්‍යාපාර ක්ෂේත්‍රයේ කටයුතුකර ඇති දක්ෂ පළපුරුදු අයෙකි. මෙය එම ව්‍යාපාර ආයතනයේ,

(1) ශක්තියකි. (2) දුර්වලතාවයකි. (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

16 අයිතිය අනුව ව්‍යාපාර සංවිධාන ප්‍රභේද වර්ග කිරීමේ දී පෞද්ගලික අංශයට අයත් නොවන ව්‍යාපාර සංවිධාන ප්‍රභේද කුමක් ද?

(1) ඒක පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර

(3) සංස්ථාපිත සමාගම් (4) රාජ්‍ය දෙපාර්තමේන්තු

17 ව්‍යාපාරයකට අවශ්‍ය ප්‍රාග්ධනය යොදවන පුද්ගලයෝ හැඳින්වෙන්නේ,

(1) ව්‍යවසායකයෝ ලෙසය. (2) කළමනාකරවෝ ලෙසය.

(3) අයිතිකරුවෝ ලෙසය. (4) සැපයුම්කරුවෝ ලෙසය.

18 ව්‍යාපාරය සතු සම්පත් විවිධ පාර්ශව සමඟ හුවමාරු කර ගැනීම හඳුන්වන්නේ,

(1) මිලදී ගැනීමක් ලෙසය. (2) ගනුදෙනුවක් ලෙසය.

(3) විකිණීමක් ලෙසය. (4) වත්කම් හා වගකීම් ලෙසය.

19 ''ලාභය'' නිවැරදිව දක්වෙන ප්‍රකාශය වන්නේ.

(1) ලාභය = ආදායම - වියදම (2) ලාභය = වියදම - ආදායම

(3) ලාභය = වත්කම් - වගකීම් (4) ලාභය = හිමිකම් - වත්කම්

20 ජංගම නොවන වත්කම්වලට අදාළ කාණ්ඩය වන්නේ,

(1) මෝටර් රථ, ණයගැතියෝ, බඩු තොගය

(2) ඉඩම් හා ගොඩනැගිලි, මුදල්, බැංකු අයිරාව

(3) ලී බඩු, බැංකු ණය, ණය හිමියෝ

(4) ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ, මෝටර් රථ

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

පැය දෙකයි
Two hours

උපදෙස් :
- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් සිද්ධිය උපයෝගීකර ගෙන අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආයුර්වේද පාඨමාලාවක් සාර්ථකව අවසන් කළ ''හරිතා'' 2018 ජනවාරි පළමු වැනි දින තම නිවසේම කොළකැඳ ව්‍යාපාරයක් ආරම්භ කළාය. තමා ඉතිරි කර ගත් රු. 50,000 හා බැංකුවෙන් රු. 25000 ක් දිගු කාලීනව අඩුපොළියට ලබාගෙන අවශ්‍ය උපකරණ මිලට ගත්තාය. මේ සඳහා පළපුරුදු සේවිකාවක් බඳවාගත් අතර ව්‍යාපාරය ටික කලෙකින්ම ඉතා සාර්ථක විය.

(1) (i) ''හරිතා'' ගේ ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාවය හා වුවමනාව දක්වන්න.

(ii) මෙම ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ ශක්තීන් දෙකක් ලියන්න.

(iii) මෙම ව්‍යාපාරයේ දක්නට ඇති අභ්‍යන්තර පරිසර සාධක දෙකක් නම් කරන්න.

(iv) හරිතාගේ ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන ප්‍රභේදය කුමක් ද?

(v) බැංකුවෙන් අඩු පොළියට ණයක් ලබා ගැනිමට අයත්වන බාහිර පරිසර සාධකය කුමක් ද?

(vi) හරිතාගේ ව්‍යාපාරයේ දක්නට ඇති වත්කම් මොනවා ද?

(vii) මෙම ව්‍යාපාරයේ දක්නට ඇති ජංගම නොවන වගකීම්වල වටිනාකම දක්වන්න.

(viii) හරිතාගේ ව්‍යාපාරයේ අයිතිකරුවන්ගේ හිමිකම කොපමණ ද?

(xi) ඉහත ව්‍යාපාරය සංවිධාන ක්‍රමයේ වාසි දෙකක් දක්වන්න.

(x) හරිතාගේ ව්‍යාපාරය ලබාගෙන ඇති උපකාරක සේවාවක් දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 යි)

02. (i) භාණ්ඩ හුවමාරු ක්‍රමය / බාටර් ක්‍රමය යන්න පැහැදිලි කරන්න.

(ii) විද්‍යුත් මාධ්‍ය හරහා සිදුවන ව්‍යාපාර කටයුතු 02 ක් දක්වන්න.

(iii) ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණු 02 ක් දක්වන්න.

(iv) ඔබගේ අවශ්‍යතාවයන් 02 ක් දක්වා එම අවශ්‍යතා වලට අදාළ වුවමනා 02 බැගින් දක්වන්න.

(v) වුවමනාවක ලක්ෂණ 02 ක් නම් කරන්න.

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 යි)

03. (i) සේවා සැපයීමේ නිරතවන ව්‍යාපාර 04 කට නිදසුන් දක්වන්න.

(ii) ප්‍රධාන නිෂ්පාදන සාධක 04 නම් කර ඊට නිදසුන බැගින් දක්වන්න.

(iii) පහත සඳහන් ප්‍රකාශ ''සත්‍ය'' ද, ''අසත්‍ය'' ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක අයිතිකරු අභ්‍යන්තර පරිසර සාධකයක් වන අතර ගණුදෙනුකරුවන් බාහිර පරිසර සාධකයක් වන අතර ගණුදෙනුකරුවන් බාහිර පරිසර සාධකයක් වේ.

(ආ) මිනිස් අවශ්‍යතා විවිධ වන අතර වුවමනා සීමිත වේ.

(ඉ) ව්‍යාපාර අවධානම් දරමින් නව්‍යතා සම්පාදනය සඳහා තීරණ ගන්නා ව්‍යවසායකයා වේ.

(ඊ) ඕනෑම ව්‍යාපාරයක අරමුණු ලාභ ඉපැයීමයි.

(iv) ඔබගේ පාසල කෙරෙහි ඇල්මැති පාර්ශව 4 ක් දක්වන්න.

(v) රජය ව්‍යාපාර කෙරෙහි ඇල්ම දැක්වීමට හේතුවන අරමුණු 02 ක් දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 යි)

04. (i) ව්‍යාපාර පරිසරය යනුවෙන් කුමක් අදහස්වේ ද?

(ii) බාහිර පරිසරයට අයත් සාධක 04 ක් නම් කරන්න.

(iii) දේශිය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම් 02 ක් දක්වන්න.

(iv) ව්‍යාපාරයකට මුහුණ දීමට සිදුවිය හැකි තර්ජන 02 කට නිදසුන් දක්වන්න.

(v) ව්‍යාපාරයකට මුහුණ දීමට සිදුවිය හැකි තර්ජන 02 කට නිදසුන් දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 යි)

05. (i) ගිණුම්කරණය යනු කුමක් ද?

(ii) ව්‍යාපාරයකට ගිණුම්කරණය අවශ්‍ය වීමට හේතු දෙකක් දක්වන්න.

(iii) ව්‍යාපාරික ගණුදෙනුවක් යනු කුමක් ද?

(iv) ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු 4 කට නිදසුන් දක්වන්න.

(v) ව්‍යාපාරයක සිදුවන ගනුදෙනුවල ප්‍රතිඵලය ලෙස ජනිත වන දේ මොනවාද

(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10 යි)

06 (i) වත්කම් යනුවෙන් කුමක් අදහස්වේ ද?

(ii) ව්‍යාපාරයක දක්නට ඇති වත්කම්, වගකීම් ආදායම් සහ වියදම් කීපයකට නිදසුන් පහත දැක්වේ. ඒවා වත්කම්, වගකීම්, ආදායම්, වියදම්, යනුවෙන් වර්ග කර දක්වන්න.

★ ලීබඩු උපකරණ
★ මෝටර් රථය
★ විකුණුම්
★ රක්ෂණ ගාස්තු
★ ණය හිමියෝ
★ බැංකු ණය
★ ණය ගැතියෝ
★ පොලී ලැබීම

(එක ශීර්ෂයකය ලකුණු 02 බැගින් ලකුණු 08)